# පාලි සාහිත්‍යයේ ගර්හාවාචක ප්‍රයෝග

අරුණා කේ. ගමගේ

ගර්හාවාචක ප්‍රයෝග යන්නෙන් මෙහි දී හැඳින්වෙන්නේ අසභ්‍ය වචන හා පරුෂ වචන වශයෙන් හඳුනාගත හැකි යෙදුම් ය. අසභ්‍ය වචන සම්බන්ධයෙන් විමසීමේ දී පෙනී යන කරුණක් නම්, වර්තමානයෙහි බොහෙවින් ම පරුෂ වචන හා අසභ්‍ය වචන යන දෙක ඒකත්වයෙන් සැලකෙන බව යි. යම්කිසි පරුෂ වචනයක් වේ නම් එය නියතයෙන් අසභ්‍ය වචනයක් ද වේ යනු සාමාන්‍ය පිළිගැනීම බවට පත්ව ඇත. තත්ත්වය මෙසේ හෙයින් මේ දෙක අන්‍යොන්‍ය ලෙස හඳුනා ගැනීම තරමක දුෂ්කරභාවයක් ව පවතී. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ පරුෂ වචන මෙන් ම අසභ්‍ය වචන පිළිබඳව ද තොරතුරු සඳහන් වන සන්දර්භයන් බොහෝ සෙයින් එක හා සමාන වීම යි. අසභ්‍ය යන වචනය අසබ්භ යනුවෙන් පාලි භාෂාවෙහි සිටී. මෙම ව්‍යවහාරය පාලි ත්‍රිපිටකයේ විවිධ ස්ථානවල දක්නා ලැබේ.[1] අසභ්‍ය යන්නෙහි ශබ්දාර්ථයෙන් සභාවට යෝග්‍ය නො වූ, සභා වැදගත්, පහත් ආදි විවිධ අර්ථ ගම්‍ය කෙරේ.[2] ධම්මපාල හිමියෝ උදාන අට්ඨකථාවේ දී ඒ සඳහා *සභාවට අයෝග්‍ය වූ, ප්‍රසිද්ධියෙහි හෝ යහපත් දනන් සමූහයෙහි ප්‍රකාශයට නුසුදුසු වූ සාපතේයි වදන්* යනුවෙන් අරුත් වෙනෙති.[3] මෙම අර්ථකථනයෙහි අසභ්‍ය යන වචනයට පර්යාය වශයෙන් *දුට්ඨුල්ලවාචා* යන්න යෙදී ඇත. *දුට්ඨුල්ලවාචා* යනු ලිංගේන්ද්‍රිය හා මෛථුන ධර්මය සමග සම්බන්ධ පහත් කතාවලයෙහි ව්‍යවහාරයක් බව පාරාජිකපාළි පදභාජනීය පවසයි.[4] එවිට අසභ්‍ය වචන යනු ලිංගිකත්වය හෝ මෛථුන්දම් ආශ්‍රය කොටගෙන නිපැයුණු පහත් වචන බව පිළිගැනීම නුසුදුසු නො වේ.[5] ලිංගික කටයුතු හා සම්බන්ධ නො වූව ද ශිෂ්ට සම්මත නො වූ ව්‍යවහාරයන් ද අසභ්‍ය වචන යටතෙහි සංග්‍රහ කළ හැකි බව ඒ වචනය සඳහා ඉදිරිපත් වී ඇති අර්ථකථනයන්ගෙන් පැහැදිලි වේ.